**ධීවර ත්‍යාග අරමුදල - 2021**

**--------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**--------------------------------**

ධීවර ත්‍යාග අරමුදලේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**---------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**-----------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විෂයය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | | රු. | | | |
| (අ) | වැටලීම් සඳහා දායක වූ නිලධාරීන්ට ගෙවිය යුතු දීමනා | 1,658,092 | උපලේඛන | අදාල වන නිලධාරීන් නිශ්චිතව හදුනාගැනීම සඳහා මේ වන විටත් පියවර ගෙන ඇති බව. | වැටලීම් සඳහා දායක වූ නිලධාරීන්ට ගෙවිය යුතු දීමනා පිළිබඳ විස්තරාත්මක උපලේඛන පිළියෙල කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය දක්වා දිස්ත්‍රික් ධීවර කාර්යාල 15 ක් විසින් අත්අඩංගුවට ගෙන ඇති භාණ්ඩ හා උපකරණ | | අත් අඩංගු වට ගත් භාණ්ඩ හා උපකරණ පිළිබඳව ලැයිස්තු | නඩු කටයුතු අවසන් වූ හා රාජසන්තක භාණ්ඩ පිළිබදව දිස්ත්‍රික් කාර්යාල වලින් ලබා ගෙන විමර්ශන අංශයේ ගොනු පවත්වාගෙන යනු ලබන බව. | පවත්නා පද්ධතියට අනුකූල විය යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2013 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා පැවත එන ලැබිය යුතු මසුන් අලෙවි ආදායම 2021 දෙසැම්බර් 31 දින වන විට රු.2,526,585 ක් වූ අතර එම ලැබිය යුතු ආදායමෙන් ඉකුත් වර්ෂයට අදාලව පමණක් රු.211,200 ක් අය කරගෙන තිබුණු හෙයින් හිඟ ආදායම් අයකර ගැනීම දුර්වල තත්ත්වයක පැවතිණි. | ලැබිය යුතු මසුන් අලෙවි ආදායම වන රු.2,143,095 අය කර ගැනීමට කටයුතු කරමින් පවතී. | ලැබිය යුතු ආදායම් කඩිනමින් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | | රු. | | |
| 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ 59(2) වගන්තිය | (i) | ත්‍යාග අරමුදලේ පරිපාලනය සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයා වගකිව යුතු වුවද ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් 2018 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලසුම්වල ත්‍යාග අරමුදලේ කාර්යයන් හඳුනාගෙන ඵලදායී ලෙස ඉටුකර ගැනීම සඳහා සැලසුම් සකස් කර නොතිබුණි. | සමහර රාජසන්තක වන නඩු පිළිබඳව පූර්ව නිගමන වලට එළඹීම අපහසු වන බැවින් ත්‍යාග අරමුදල පිළිබඳව ක්‍රියාකාරී සැලසුම් සඳහා ඇතුලත් කළ නොහැකි බව. | ත්‍යාග අරමුදලේ කාර්යය භාරයන් හඳුනාගෙන ඵලදායී ලෙස ඉටුකිරීම සඳහා අවශ්‍ය සැලැසුම් සකස් කර ක්‍රියාත්මක කළ යුතුය. |
| | (ii) | වැටලීම්වලට සහභාගී වූ නිලධාරීන්ට ත්‍යාග මුදල් ලබාදීම අප්‍රමාදව කළයුතු වුවත් 2014, 2015, 2016, 2017, 2018, 2019, 2020 හා 2021 වර්ෂවල පිළිවෙලින් නඩු 271, 348, 488, 427, 327, 604, 536 හා 692 ක් ලෙස සිදුකර තිබුණි. 2014,2017,2018 හා 2020 වර්ෂවල දී කිසිදු ත්‍යාග මුදල් | 2013 වර්ෂයේ සිට ධීවර ත්‍යාග ලබා ගැනීම් පිළිබඳව දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂක වරුන් දැනුවත් කර ඇති බව. | දීමනා ගෙවීමට කඩිනම් ක්‍රමවේදයක් සකස් කළ යුතුය. |

ගෙවා නොතිබුණු අතර 2021 වර්ෂය තුල නඩු 08 කට අදාලව ගෙවූ දීමනා ප්‍රමාණය රු.179,985 ක් පමණක් වූයෙන් 2021 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු දීමනා රු.1,658,092 ක් විය. මේ අනුව නිලධාරීන් වෙත ත්‍යාග මුදල් ලබාදීම සඳහා කඩිනම් ක්‍රමවේදයක් සකස් නොකිරීම හේතුවෙන් නීති විරෝධී ධීවර කටයුතු වැටලීම් සඳහා නිලධාරීන් දිරිගැන්වීමක් සිදුනොවන බව නිරීක්ෂණය විය.

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 197,872ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් අතිරික්තය රු. 798,616ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.600,744ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට රාජසන්තක කළ භාණ්ඩ විකිණීමෙන් ලද ආදායම රු. 1,248,177 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසානයේ පැවති රු.8,970,439 ක මුදල් ශේෂයෙන් ත්‍යාගලාභීන්ට ගෙවිය යුතු මුදල් හා රජයේ දායකත්වය නිරූපණය කරනු ලැබුව ද ගෙවිය යුතු දීමනා ලෙස මූල්‍ය ප්‍රකාශනවල රු.1,658,092 ක් පමණක් පෙන්වා තිබුණි. මේ අනුව ඉතිරි රු. 7,312,347 ක මුදලට හිමිකම් කියනු ලබන ත්‍යාගලාභීන් හා ඊට අදාල රාජ්‍ය ආදායම කොපමණද යන්න හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී හදුනාගැනිමටත් නිරවුල් කිරිමටත් කටයුතු කරන බව. | වැටලීම්වලට සහභාගීවන්නන්ගේ ලේඛන අනුව ත්‍යාග සඳහා හඳුනාගත නොහැකි ශේෂයන් පවතින්නේනම් රජයේ ආදායමට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ත්‍යාග අරමුදලින් ගෙවීම් කිරීමේ දී තොරතුරු ලබාගැනීමට හැකිවන පරිදි හා විනිවිදභාවයකින් යුක්තව කටයුතු කිරීමට හැකිවන පරිදි වැටලීම්වලට සහභාගී වූ නිලධාරීන්ගේ නම, තනතුර, නඩු අංකය, | ඉදිරියේදී වැටලීම් කරන විට තොරතුරු ලබා දෙන ඔත්තුකරුවන් පිළිබදව තොරතුරු පවත්වා ගෙන යාමට උපදෙස් දෙන ලද | නිලධාරීන් හඳුනාගත හැකිවන ආකාරයට ලේඛනගත කිරීම් සිදුකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ගෙවීම් වවුචර් අංකය, ගෙවීම් ලාභීන්ගේ අත්සන් යනාදි තොරතුරු ඇතුළත් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | අතර 2021 වර්ෂයේ සිට තොරතුරු ලේඛනයක් පවත්වාගෙන යන බව. | |
| (ඇ) | 2021 වර්ෂය තුල සියලුම දිස්ත්‍රික් ධීවර කාර්යාල හරහා නඩු 692 ක් පවරා තිබුණි. දිස්ත්‍රික් ධීවර කාර්යාල 3 කින් පමණක් රාජසන්තක භාණ්ඩ විකුණුම් ආදායම් ත්‍යාග අරමුදලට බැර වී තිබුණු නමුත් අනෙකුත් දිස්ත්‍රික් ධීවර කාර්යාල කිසිවකින් ත්‍යාග අරමුදලට ආදායම් ලැබී නොතිබීම සම්බන්ධයෙන් කළමනාකරණය අවධානය යොමු කර නොතිබුණි. | අධිකරණය මගින් දඩ නියම කිරීමෙන් පමණක් අවසන් කරන නඩු වැඩි වශයෙන් ඇති බවත් එම දඩ මුදල් ධීවර ත්‍යාග අරමුදලට බැර නොවන බව. | දිස්ත්‍රික් ධීවර කාර්යාලවලින් ත්‍යාග අරමුදලට ආදායම් ලැබී නොතිබීම සම්බන්ධයෙන් කළමනාකරණය අවධානය යොමු කළ යුතුය. |
| (ඈ) | දිස්ත්‍රික් ධීවර කාර්යාල සඳහා සැලසුම් කරන ලද වැටලීම් පිළිබඳ තොරතුරු ඉදිරිපත් නොවූ අතර ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ විමර්ශන අංශය විසින් සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද වාර්තා අනුව 2021 වර්ෂය තුල සැලසුම් කළ වැටලීම් අතරින් සිදුකරන ලද පරීක්ෂණ වැටලීම්වල ප්‍රගතිය සියයට 0 ක සිට සියයට 20 ක් දක්වා පරාසයක විය. | 2021 වර්ෂයේ පළාත් අතර සංචරණ සීමා, සාමූහික ඒකරාශි වීම් නැවැත්වීම, හේතුවෙන් අපේක්ෂිත ඉලක්ක කරා ලගා විය නොහැකි වූ බව. | අපේක්ෂිත ඉලක්ක කරා ලගා කර ගැනීමට කටයුතු කළයුතුය. |